සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

71 S I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

## Second Term Test - Grade 12 - 2020

විභාග අංකය ..............................

## සිංහල I

කාලය පැය තුනයි

- ❖ **පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- ❖ **පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.**

01. පහත දී ඇති උද්ධෘත අතුරෙන් හතරක් තෝරා ගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න)

(අ) එසේ හෙයින් තොපගේ මාලුකම පිහිටා මෙවක් පටන් දරුසෝක නොකරමි. වියෝගය සරි වුවත් උන් ශෝක නොකරන කල මා කරන ශෝකයෙන් වන්නේ ශරිරය වියළෙන පමණෙක. කථාව කරන කල කාරණා නොසැලකෙතත් පසුව සලකන කලට නුවණැත්තවුන්ට යහපත්ව හැඟෙයි. මටත් අනුශාසනා අසා හැම ම සැලකිණ. යම් කෙනෙක් පෙර පුරුදුකමක් නැතිව අමුතුවලා සහයක් වූ නම් උන් හැඳින්න මැනව. එසේ හෙයින් තෙපි කවුරුන්දැයි විචාළෝය. ඒ අසා දේවතාවාණෝ යම් කෙනෙකුන් අරහයා තොපි හඬවූ නම් ඒ තොපගේ මළ පුතණුවෝ නම් මම ය. ගොසින් දෙව්ලොව උපනිමියි කිවුය. ඒ අසා බමුණාණෝ තොප මිය වෙන්වන තෙක් අපගේ ගෙන් වෙන්වූවා නැත. ඒදෑතුරේ දනක් පිනක් කරන්නා නුදුටුම්හ. දෙව්ලොව උපන්නේ කුමන පින්කමක් කොට ද තොප දෙව්ලොව උපදනා කල දෙව්ලොව නූපදනවුන් නැති නියාවේදැ'යි විචාළෝ ය.

(i) බමුණා සිය ශෝකය තුනීවූයේ කුමක් නිසා යැයි කියයි ද?
(ii) යමෙකු දැන හැඳින ගත යුත්තේ කවරක් නිසා දැයි මෙහි දැක්වේද?
(iii) ''තොපගේ මාලුකම පිහිටා මෙවක් පටන් දරුශෝක නොකරමි'' යන්නෙහි අර්ථය ලියන්න.
(iv) ''දෑතුරේ'' යන්නට අර්ථ විවරණ ලියන්න. (ලකුණු 4)

(ආ) එබසට අනුරුද්ධ කුමාරයෝ 'යහළු, ජරා මරණ දෙදෙනාගේ පසු පළමු වීමෙහි විභාගයෙන් නැත. සමහර කලෙක ජරාව පළමුව යෙයි. සමහර කලෙක ජරාවට මරණ පළමුව යෙයි. තෙලෙ නුවණෙක් නොවෙයි. අප බුදුහු එකුන්තිස් ඇවිරිද්දෙහි කාම සුව හැර සත් දවසකින් ලැබෙන සක්විති රජය හැර මහණ වූහ. උදායින් ආදී වූ මෙම නුවර මහ ඇමතියෝ ද නව යෞවනයෙහි මහණව අමා මහ නිවන් දැක දැන් අප ඉස පියපස් වගුරුවාගෙන ආකාශයෙන් ඇවිදිති. අපි ඔවුන් වඳුම්හ; පුදම්හ; සත්කාර කරම්හ; මෙයිදු ලජ්ජාවකට ඇත. කාම සුව විඳීම නම් නුවණැසින් බැලූ කල සුව විඳීමක් නොවෙයි; දුක් විඳීමක, එකලාව වලට ගොස් තපස් කිරීම නම් විශේෂයෙන් බැලූ කල දුක් විඳීමක් නොවෙයි; ඒකාන්ත සුව විඳීමෙක. යහළු දෙබසක් නොකියව, මහණ වන්නට යම්හ'යි කීහ.

(i) නිත්‍ය සුව විඳීමක් ලෙස මෙම ඡේදයේ දැක්වෙන්නේ කුමක්ද?
(ii) අනුරුද්ධ කුමරු පවසන ලජ්ජාවට හේතුව කුමක්ද?
(iii) ''එකුන් තිස් ඇවිරිද්දෙහි කාම සුව හැර'' යන උද්ධෘත පාඨය ලිහිල් බසින් ලියන්න.
(iv) 'ජරාව' යන වචනයට කෙටි විවරණ සපයන්න. (ලකුණු 4)

(ඈ) ඉතා ලෙටි වූ අදින්න පුබ්බක බමුණු ද සෝවාන් ව ඇඹුලකින් තඹ මලකඩ නැතිවන්නා සේ ලෝභ සිත් මඳව තමාගේ වස්තුව නිධාන ගත ව තැබුවා තුබූ නියාව නොසේම හෙයින් උගුළුවා හැරගෙන කවර ලෙසකිනුත් නොනස්නා ලෙසට අනුගාමික නිධාන කොට බුදු සසුන නමැති ක්ෂේම තැන ලයි. මෙසේ මේ කුලදරුවාණන් නිසා බොහෝ ප්‍රයෝජන වෙයි. දැන වදාරා දෙවන දවස් උදෑසන අලතා පිඩෙක ඇතිවූ පබළු දලු වැනි වූදෝ නොහොත් ලාරසෙහි ගලා ඔසවාගත් කොබෝලීල මල්දමක් වැනි වූ තමන් වහන්සේගේ හඳනා සිවුර රත් කොට ගෙන ත්‍රිමණ්ඩලපටිච්ඡාදන වශයෙන් පෙකණියත් දෙදණ මඩුලුත් වසා පුන් සඳ මඩලෙන් භාගයක් රත්වලායෙකින් වසන කලක් පරිද්දෙන් වැළඳගෙන ඊමත්තෙහි පබළු සමූහයක් රන් පමුවකින් වෙළන්න කලක් පරිද්දෙන් විදුලියක් හා සමාන වූ පටිධාතුන් වහන්සේ බැඳගෙන ඉක්බිති නුගපක් සමූහයක් වැනි වූ දෝහෝ නොහොත් බඳු වදමල් ඇතිරියක් වැනි වූ සුගත් පොරෝනා සිවුර රත්පලසකින් ඇත් කුඹක් වසන්නාක්හු මෙන් ද, නොහොත් සියක් රියන් උස ඇති රන් ඇගෑයක් පබලු දැලකින් වසන්නාක් හු මෙන්ද,

(i) බමුණාගේ ලෝභය දුරු වූයේ කෙසේ ද?

(ii) ඇත් කුඹුවලට උපමා කරන්නේ කුමක්ද?

(iii) "විදුලියක් හා සමාන පටිධාතුන් වහන්සේ'' යන්නෙහි අර්ථය ලියන්න.

(iv) "ත්‍රිමණ්ඩල පටිච්ඡාදන'' යන්නට අර්ථ විවරණ ලියන්න. (ලකුණු 4)

(ඈ) ස්වාමීනී අපගේ කුලෙහි ශාක්‍යයෝ නම් ඉතා මානීයහ. මානයෙන් ම මඩනා ලදහ. 'නුඹ වහන්සේ වැනියන් පවා නො වඳුම්හ'යි මන් කළ කුලයෙක උපනුම්හ. අප ද මහණ වූ කල ඒ බඳු වූ මානයෙක් උපනි නම් එකල මහණ දම් මුදුන් පැමිණිය නොහෙයි. මේ අපගේ උපාලි නම් කපුවාණන් පළමුව මහණකොට අප පසුව මහණකොට වදාළ මැනව. එසේ කල ඔවුන් අපි වඳුම්හ. පුදම්හ. සත්කාර කරම්හ. එසේ කල අපගේ අභිමානත් සිඳෙයි. මහණදමුත් මුදුන් පැමිණෙයි. ඉදින් මතු රාජ්‍යශ්‍රීයෙහි ලෝභයකු දු වී නම් ''තොපගේ කපුවාණන් වැඳ පුදා නීච ක්‍රියා කොට නැවත රාජ්‍යය කරන්නට අවු දැයි ශාක්‍යයන් අපට පරිභව බෙණෙති යි කියා දෙවනු ව රාජ්‍ය ලෝභය ද දුරු වෙයි. මේ මේ කාරණයෙන් උන් පළමුව මහණ කරවා අප පසුව මහණ කළ මැනවැයි කීහ.

(i) ඡේදයෙහි සඳහන් පරිදි ශාක්‍යයන් සතු නුගුණ කුමක්ද?

(ii) පළමුව උපාලි කපුවා මහණ කරන ලෙස ඉල්ලීම කරන්නේ කවර හේතුව නිසා ද?

(iii) ''තොපගේ කපුවාණන් වැඳ පුදා නීච ක්‍රියා කොට නැවත රාජ්‍ය කරන්නට අවුදැයි' යන උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) 'පරිභව බෙණෙති'' යන්නට කෙටි විවරණයක් සපයන්න. (ලකුණු 4)

(ඉ) බුදුහු එදවස් අලුයම් වේලෙහි මහකුලුණු සමවතට සමවැද එයින් නැගි පෙර බුදු වූ බුදුවරුන් වහන්සේ සමයෙහි මහත් සේ කොට පුරාපී පින්කම් ඇති හේතුසම්පන්න පුද්ගලයන් දක්නා පිණිස බුදු ඇසින් ලොව බලනසේක් දසදහසක් සක්වළ නැමැති මහමුහුද වසා නුවණදැල දැමුසේක. මට්ටකුණ්ඩලී නැමති කුඩමසු පිළ නමැති දියකොල්බඩ හොත්තේ බුදුන්ගේ නුවණදැලට තමා සම්භ වුවමනා හෙයින් වැදහොත් ලෙසින් ම නොසෙල්වී නොපෙරළී නුවණදැල බැඳිණ. බුදුහු ඔහු දැක මා එතනට යාමෙන් වන ප්‍රයෝජන කවරේ දෝහෝයි පරික්ෂා කරනසේක් 'මා එතනට ගිය කල මට්ටකුණ්ඩලියා මා කෙරෙහි සිත පහදවාගෙන කොටගත් අනික් පින්කමක් නැතත් සිත පහදවාගත් පමණකින් මිය ගොසින් තවුතිසා දෙව්ලොව එක්සිය විසිගව්වක් විතර උස ඇති රන් විමනක උපද්දී.

(i) මෙහි සඳහන් එදා මෙදා තුර බුදුවරුන්ගේ සිරිත කුමක්ද?

(ii) බුදු රදුන් සිතන පරිදි මෙහි වැඩම වීමෙන් සිදුවන්නේ කුමක් ද?

(iii) 'දස දහසක් සක්වළ වසා නුවණදැල දැමූසේක' ලිහිල් බසින් ලියන්න.

(iv) 'මට්ටකුණ්ඩලී' යන්නට කෙටි විවරණයක් සපයන්න. (ලකුණු 4)

(උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

1. මා එතනට යාමෙන් වන ප්‍රයෝජන කවරේදෝ හෝයි..
2. හුණු කැමැති සිහිල් ලැබේ ල.
3. එසේ වූ බසක් මා කන නොවකව.
4. කුමන පිංකමක් කොට මේ දිවසැපත් ලද්දී දැයි.
5. දැන් වෙලාව කීයට විතර ඇද්ද? (ලකුණු 3x4 = 12)

(ඌ) පහත දැක්වෙනකාව්‍ය නිර්මාණයෙහි ආකෘතිය ජීවන දර්ශන දක්වමින් රසාස්වාදනයක් කරන්න.

මල්වල පාට අම්මේ, කවුරුද ගෑවේ
දලු අතු පැළී ඒවා කොහොම ද ආවේ
මෙතරම් කැසුම ඇයි කහඹිලියා බූවේ
නිදිකුම්බා කොළේ මොකට ද නිදියෑවේ

පවතී අඬනහිරියා මල්වල සද්දේ
කෝඳුරු රංචු අට්ටික්කා ගෙඩි මැද්දේ
කජු ඇට පුහුලමේ යටි පැත්තෙහි පැද්දේ
අම්මේ, කෙළේ මේවා කවුරු ද බැද්දේ

ලස්සන රෝසමල් පඳුරට මොට ද කටු
කුමට ද බාඳුරා මල් කොකුවලට ගොටු
කජු ලුනුම්දෙලි ගස්වල මේ ඇලෙන හොටු
ගෑවේ කවුද මට කිව මැන කෙනෙකු දුටු

කොළයෙන් අක්කපානා මුල් අදිනු පෙනේ
කෝමාරිකා මද සීතල මොක ද අනේ
තුත්තිරි කරල්හැබ ඇට මගෙ ඇඳුම් කොනේ
තැවරෙයි! මෙවැනි ගති කොහොම ද පුරුදු වුණේ

කවුරු ද කුරුම්බා ඇතුළට දිය දෙන්නේ
ඇයි මේ වරා මල් සුළඟට ඉගිළෙන්නේ
මල් නැහැ දිඹුල් ගස්වල මෙලෙසින් වන්නේ
කොහොම ද කියා අම්මා නොමැති ද දන්නේ

සමහර මල් තිබේ ලස්සන එමට ඇත
එනමුදු සුවඳ නම් ගැවුණු තැනක නැත
සමහර මලක තනි සුදුමැලි පැහැය ගත
තිබුණත් සුවඳ පිනවයි දුටු අයගෙ සිත

සුදු පාටක් තිබේ දලුවල | මුස්සැන්න
නා දලු කුරුඳු දලු රත් පැහැ | පවතින්න
මද දලු බුලත් දලු කොළ පාටින් | එන්න
හැදුවේ කවුද මට ඕනෑ | දැනගන්න

කළුමැදිරිය කළුය, ඇටිටේරිය | සුදු වේ
කොස් කහ, පතඟි රතු, එක කැලයක | පොදුවේ
හටගත් ලී මෙසේ නෙක පැහැයට | බෙදුවේ
අම්මේ කවුද පවසනු මැන පින් | සිදු වේ.

ලෙලි කටු පැගිරි කෙඳි සහිතව හට | ගත්තයි
පැණි රහ, කහට රහ පල ඇති බව | ඇත්තයි
සමහර ගෙඩි ඇඹුල්, සමහර ගෙඩි | තිත්තයි
ඇයි මේ වෙනස අම්මා විමසිය | යුත්තයි (ලකුණු 12)

02. මසුරු සිතක යථා ස්වරූපය නිරූපණය කිරීම සඳහා භාෂාව හා අවස්ථා නිරූපණය උචිත ලෙස යොදා ගැනීම මට්ටකුණ්ඩලී කථා වස්තුවේ එක් සුවිශේෂී ලක්ෂණයකි. උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 15)

**නැතහොත්**

කුරුණෑගල හා දඹදෙණි යුගවල රචිත ගද්‍ය කෘතිවල සුවිශේෂතා පිළිබඳ අවධානය යොමු කරමින් එකල ගද්‍ය සාහිත්‍යයේ ස්වරූපය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ල. 15)

03. 'සමාජය තුළ ගුණ දහම් වර්ධනය සඳහා උචිත තේමා යොදා ගැනීම පූජාවලියෙහි දැකිය හැකි විශේෂත්වයකි' නිදර්ශිතව පහදන්න. (ල. 15)

**නැතහොත්**

සිංහල සාහිත්‍යයේ ප්‍රබෝධයට ගම්පොළ සාහිත්‍ය යුගයේ දී ලැබුණ දායකත්වය කෙබඳුදැයි පිරික්සන්න. (ල. 15)

04. (අ) 'කෝට්ටේ යුගය පද්‍ය සාහිත්‍ය කලාවේ ස්වර්ණමය යුගයකි' නිදර්ශිතව දක්වන්න. (ල. 7)

(ආ) 'ගුත්තිල කාව්‍යයෙන් විද්‍යාමාන වන සුවිශේෂී ලක්ෂණ පෙන්වා දෙන්න. (ල. 8)

05. සිංහල නවකතාවේ ප්‍රභවයට පදනම් වූ සාමාජීය ප්‍රවණතා පිළිබඳ පැහැදිලි කරන්න. (ල. 15)

06. සිංහල කෙටිකතාවේ විකාශන අවධි පිළිබඳ කෙටි හැඳින්වීමක් කර එකී කාලවල කෙටිකතාවේ ස්වරූපය පිළිබඳ සංක්ෂිප්ත විවරණයක යෙදෙන්න. (ල. 15)

07. කොළඹ යුගයේ ප්‍රථම තරංගයේ කවීන් පද්‍ය නිර්මාණයයේ දී වැඩි නැඹුරුවක් දැක්වූ කාව්‍ය තේමා හා කාව්‍ය ලක්ෂණ මොනවාදැයි නියමිත පද්‍ය පන්ති දෙකක්වත් ඇසුරින් විමර්ශනය කරන්න. (ල. 15)

08. සිංහල නාට්‍ය සාහිත්‍යයේ ආරම්භය හා විකාශනය පිළිබඳ කරුණු ගෙනහැර දක්වන්න. (ල. 15)

* * *

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

71 S II

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

Second Term Test - Grade 12 - 2020

විභාග අංකය ............................ සිංහල II කාලය පැය තුනයි

- I කොටසේ 1 ප්‍රශ්නය ද II කොටසේ 2 හා 3 ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- I ප්‍රශ්නයේ ඇති සියලු ම අනුකොටස්වලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- I කොටස II කොටසේ පිළිතුරුපත් සමඟ අමුණා භාර දෙන්න.

## I කොටස

01. එක් එක් ප්‍රශ්නයට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එයට හිමි අංකය වරහන තුළ ලියන්න.

1.1 මූර්ධජ අක්ෂර පමණක් අන්තර්ගත වරණය වන්නේ,

1. ය, ර, ල, ව 2. ප, ඵ, බ, භ, ම 3. ර, ෂ, ට, ඨ
4. ර, ෂ, ල, ණ 5. ශ, ෂ, හ, ළ (.........)

1.2 අක්ෂර වින්‍යාසය නිවැරදි වරණය වන්නේ,

1. පුන්කලස, මාළිගාව, හලාහල, දොඩමලු, නිත්‍යනුකුල
2. පුන්කළස, මාළිගාව, හළාහල, දොඩමලු, නීත්‍යනුකුල
3. පුන්කලස, මාලිගාව, හලාහළ, දොඩමළු, නීත්‍යානුකුල
4. පුන්කලස, මාලිගාව, හලාහල, දොඩමළු, නීත්‍යානුකුල
5. පුන්කළස, මාලිගාව, හළාහල, දොඩමලු, නීත්‍යානුකුල (.........)

1.3 අකාරාදී පිළිවෙළ අනුව නිවැරදි වරණය වන්නේ,

1. අසක්දාකව, අමාවතුර, අසනිවැසි, ඇස්වැන්න.
2. සද්ධර්මරත්නාවලිය, සද්ධර්මාලංකාර, සියබස්ලකර, සීගිරිය
3. මකරානන්දය, සෙංකොට්ටං, යකඩසිල්පර, ගරුඬ මුහුර්තය
4. මයුර සන්දේශය, ගිරා සන්දේශය, හංස සන්දේශය, කෝකිල සන්දේශය
5. වස්සානය, ගිරිකුළ,විදිම්, ජනාධිපති (.........)

1.4 පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. රේඵය, රකාරාංශය වෙනුවට යොදන ශබ්ද සංකේතයකි.
2. රේඵය, සංස්කෘත, තත්සමවල පමණක් යෙදේ.
3. ඍකාරාය නියෝජනය සඳහා ද රේඵය යොදයි.
4. රේඵයට පසුව 'ය' අකුර නොයෙදේ.
5. රේඵයකට පසුව යෙදෙන තනි ව්‍යංජනය ද්විත්ව කරයි. (.........)

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

1. ග්‍රන්ථ ව්‍යාකරණ, පාරිභාෂික ශබ්ද, සාහිත්‍ය උලෙළ, නිර්මාණ කෞශල්‍ය
2. ප්‍රමාණ සමීක්ෂණය, අඛණ්ඩ අධ්‍යාපනය, දක්ෂිණ දේශය, ආරෝග්‍ය ශාලාව.
3. දශරාජ ධර්මය, තෙවළා දහම්, ත්‍රිරෝද රිය, ථේරිගාථා
4. තෘණ භූමිය, ඥාන ගවේෂණය, රංග භූමිය, ජ්‍යේෂ්ඨ සිසුන්
5. ජංගම ගිණුම, ජංගම රථය, ජනශ්‍රැති විද්‍යාව, සොර පුරුෂයා (.........)

1.6 තත්සම වචන පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

1. අක්කා, අම්මා, අප්පා, නංගි
2. ගිරි, දින, මුනි, සුර
3. බස්, ලොරි, වෑන්, කරත්ත
4. අමර, මරණ, තුරුණු, රස
5. ග්‍රාම, යක්ෂ, පූර්ණ, තර (.........)

1.7 තද්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

1. සැවුල්, මොනර, කිකිළි, ලිහිණි
2. රුක්, යක්, සත්, මාතෘ
3. පාසල, සූකිරි, ඔරලෝසු, ඉස්තෝප්පු
4. පුස්තක, අල්මාරි, නොනිසි, ඇබෑර්තු
5. සබන්, අයිස්, පර්චස්, පවුම් (.........)

1.8 කරණ, සබඳ, අවධි, අදර විභක්තිවලට අයත් සමාස පද පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

1. සොරබිය, මල්වැල්, මව් සෙනෙහස, බැංකු මුදල්
2. බැංකු මුදල්, මව්සෙනෙහස, සොරබිය, මල්වැල්
3. මල්වැල්, මව්සෙනෙහස, සොරබිය, බැංකුමුදල්
4. මව්සෙනෙහස, බැංකු මුදල්, සොරබිය, මල්වැල්
5. සොරබිය, මව්සෙනෙහස, මල්වැල්, බැංකු මුදල් (.........)

1.9 කෘදන්ත පදයක් අන්තර්ගත නොවන වරණය තෝරන්න.

1. හපනා, බලනා, දුවනා, පනිනා
2. කළ, මළ, අතුළ, විචාළ
3. පෑ, බැලූ, ඉරූ, පිවිසි
4. සැපුණ, ලැබුණු, කියුම්, හැඬුමන්
5. කැපෙනා, ලියෙනා, මලිනා, දෙඩෙනා (.........)

1.10 පහත සඳහන් උද්ධෘතවල තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්නව්

(අ) උන් එදා දුන් රග **<u>දුටොත්</u>** තව සක් සැපත් කවරෙක් පතා
(ආ) **<u>නටපන්</u>** ඉතින් සීතාවක යොවුන් ළඳේ.
(ඇ) බුදු වන්නට බාදා නැත සතොසින් බුදු **<u>වෙම්මා.</u>**
(ඈ) පැටවා දුවන්නට විය මළ පඳුරු **<u>බිඳ</u>.**

1. අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, පූර්ව ක්‍රියා
2. පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
3. විධි ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා
4. පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
5. අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, ආශිර්වාද ක්‍රියා (.........)

1.11 තද්ධිතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
1. නැණවත්, ධීමත්, රසවත්, දිරිමත්
2. තන්තුමය, දැවමුවා, රිදීමුවා, පිනිමුවා
3. මුහුලස්, සවනත්, වෙරළස්, සිසිලස්
4. පාපතම, පාපතර, උදාරතම, උදාරතර
5. මූලික, ව්‍යාපාරික, කැනිති, ළැදියා (.........)

1.12 උපසර්ගයක් යෙදී නොමැති පදයක් සහිත පද පේළිය තෝරන්න.
1. ප්‍රභේද, පරාජය, අපද්‍රව්‍ය, පබඳ
2. සඵල, සම්මාන, සංයෝග, සංකල්පනා
3. පරිපථ, අභිමාන, උත්තල, අපිධාන
4. නීරස, අනවශ්‍ය, අකල්, විමුක්ති
5. දුස්සාධ්‍ය, දුර්දාන්ත, ඉක්බිති, පිළිබඳ (.........)

1.13 නිපාතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
1. එහෙත්, හෝ, යළි, වැළි
2. සෙද, නොලසා, වහා, ලූ
3. කොල, ඔහෝ, නිබඳ, සුවඳ
4. යළි, පිළි, දැන්, වනාහී
5. වෙත, පිණිස, ඉහි, ල (.........)

1.14 '**<u>හෙළ</u>**න නගන අත **<u>නුවනග</u>** බැලුම් **<u>දිදී</u>**' යන පද්‍ය පාඨයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?
1. කෘදන්ත, සන්ධි, ක්‍රියා
2. ක්‍රියා, සන්ධි, කෘදන්ත
3. කෘදන්ත, ක්‍රියා, සන්ධි
4. ක්‍රියා, කෘදන්ත, සන්ධි
5. සන්ධි, කෘදන්ත, ක්‍රියා (.........)

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.
1. කෑවොත්, බීවොත්, වැස්සොත්, සවණොත්
2. දිනේවා, ලැබේවා, සැනසේවා, බලාවා
3. ආවේය, කළාය, නැටුවාය, බැලුවාය.
4. කරති, බලති, සොයති, බලහු
5. නටත, බලත, සොයත, කරව (.........)

1.16 සමාසයක් **<u>නොවන</u>** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
1. තල්පොල්, බුලත්පුවක්, තොවිල්පවිල්, ඕලුනෙළුම්
2. සරණිවි, මලවි, තිසුලවි, විදුරවි.
3. අවපස, සිව්පස, දෙපස, වම්පස
4. නිමල, විමල, අනුබල, පබල
5. මල්කම්, තිරරෙදි, දෙව්විමන්, රජදූ (.........)

1.17 එකම වර්ගයට අයත් සන්ධි පද වරණය තෝරන්න.
1. හත්තඩිය, මල්ලත්ත, තල්ලත්ත, වක්කත්ත
2. වරඟන, මුනිතුමා, දසතින්, දැතින්
3. උපනුපන්, එදිනෙදා, පලාපල, එකිනෙක
4. සද්දින, ඇද්දළ, සිත්තරු, වක්කඩ
5. දෙයාකාර, වියවුල්, මල්ලුයන, සිවුරඟ (.........)

1.18 ව්‍යාකරණානුකූල ව **<u>නොගැළපෙන</u>** පදයක් සහිත වරණය තෝරන්න.

1. පසඟ, සාදර, මුනීන්ද්‍ර, නරේන්ද්‍ර
2. දැනුම්වත්, පෙම්වත්, සෙනෙහෙවත්, ආලෝකවත්
3. හිරුසඳු, වනමල්, අනුරූ, අපමණ
4. නරනා, සරනා, කරනා, බලනා
5. තෙක්, දක්වා, තුරු, පටන් (.........)

1.19 ව්‍යාකරණානුකූල ව නිවැරදි වැකිය තෝරන්න.

1. රළ පෙළ වෙරළෙහි හැපී ආපසු දිව ගියහ.
2. රෝගීන්ගෙන් සිව්දෙනෙකු සුවපත් වූහ.
3. ශිල්පායතනයෙහි උගත්තු ඇත.
4. අපි සත්තු වත්ත නැරඹීමට ගියෙමු.
5. අමරදේව සූරීහූ විශිෂ්ට ගාන්ධර්වයෙක් විය. (.........)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.

1. එහෙනම්, අපි යමු නේද?
2. ඇය ගොඩක් මහන්සිවෙලා පාඩම් කළා.
3. කවුරුත් එකාවන් ව සමගියෙන් වැඩ කළහ.
4. සමන් දෙවියන්ට මේ දුක පෙනීයන්!
5. එපා! මුහුද නුඹ ගොඩට ගලන්නට. (.........)

(ලකුණු 20)

# II කොටස

- **මෙම කොටසින් 2, 3 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

02. (අ) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

නවක ශිෂ්‍යයාට අවශ්‍ය වන්නේ නායකත්වය පුහුණුවක් නොව විශ්ව විද්‍යාල ඉතිහාසය විශ්ව විද්‍යාල සම්ප්‍රදාය විශ්ව විද්‍යාල ජීවිතය හා විශ්ව විද්‍යාල ප්‍රජාව ඇතුළත් කරගන්නා වූ අනුස්ථාපනයකි. විශ්ව විද්‍යාල සිසුන් අයිවර් ඩෙනිස්ගේ නමින් නම් ශාලාවක් නම් කළාට කමක්නැතැයි කියන මට්ටමට ඇද වැටුණේ එබඳු අනුස්ථාපනයක් නොමැති හෙයිනි. හමුදාවේ නායකත්ව ක්‍රම නායකත්ව ශෛලීන් හා සන්නිවේදන ක්‍රියාදාමය ගැන අමරකීර්ති මහතා පවසා ඇති සරල කාරණා සමග අපට විවාදයක් නැත. එහෙත් විශ්ව විද්‍යාලයේ දී අප දියුණු කරන නායකත්ව සංකල්පය යනුවෙන් සඳහන් වෙද්දී එම නායකත්ව සංකල්පය කුමක්දැයි අපට පැහැදිලි නැත. අපට ගැටලුවකට ඇත්තේ විශ්ව විද්‍යාල අධ්‍යාපනය මගින් මෙතෙක් අප රටට හඳුන්වා දී ඇති නායකත්වය සංකල්පය කුමක්ද යන්නයි. විශ්ව විද්‍යාල මගින් ගොඩනගන ලද නායකයන් කවුරුන් ද යන්නයි. විශ්ව විද්‍යාලවල ශිෂ්‍ය ව්‍යාපාරයේ හා විවිධ ස්වේච්ඡා සංවිධානවල සැරිසරන තාවකාලික නායකයන් සිටිය හැකි වුව ද ඔවුන් විශ්ව විද්‍යාල අධිකාරීන් විසින් හෝ ආචාර්යවරුන් විසින් බිහිකොට ගොඩනගන ලද නායකත්වයක් නොවේ. වර්තමාන ශිෂ්‍ය ව්‍යාපාරය දෙස බලන විට එහි නායකත්වය මුළුමණින් ම වාගේ බාහිර දේශපාලන බලවේග විසින් නිර්මාණය කරන ලද්දකි. නවක සිසුන්ට නායකත්ව පුහුණුවක් අවශ්‍යයැයි කිසිවකු තර්ක කළ ද එම නායකත්ව පුහුනණුව ලබාදිය යුත්තේ සරසවි ඇඳුරන් විසින්යැයි කියා සිටිය හැකි වුවද අපගේ අදහස වන්නේ එබඳු නායකත්ව පුහුණුවක් ලබාදීමට සුදුසු ඇඳුරන් සරසවි පද්ධතියේ නොමැති බවයි. මේ බොහෝ ඇඳුරෝ නායකයෝ නොවෙති.

1. විශ්ව විද්‍යාල පද්ධතියේ ගැටලු ලෙස ලේඛකයා දකින්නේ මොනවාද?
2. ශිෂ්‍ය ව්‍යාපාරය තුළ නිර්මාණය වී ඇති ලේඛකයෝ කෙබඳු අය වෙත්ද?
3. නායකත්වයට සුදුසු සරසවි ඇදුරන් නොමැති බව ලේඛකයා දක්වයිද?
4. විශ්ව විද්‍යාල ශිෂ්‍යයාට නායකත්වයට වඩා වැදගත් වන්නේ කුමක්ද?
5. විශ්ව විද්‍යාල ශිෂ්‍යයාට නායකත්ව පුහුණුව ලබාදිය යුත්තේ කවුරුන්ද?
6. අනුස්ථාපනය යන්නෙහි අර්ථය ලියන්න. (ලකුණු 12)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **<u>තුනෙන් එකක් පමණ වන සේ</u>** සාරාංශ කොට ලියන්න.

අපට ලැබී තිබෙන ආදී පද්‍ය කාව්‍ය ය සංස්කෘත රීතියට වහල්ව කරන ලද්දක් නමුදු ගද්‍යය එසේ නොවීය. ආදිම සිංහල ගද්‍ය කාව්‍යය ලෙස සැලකිය යුතු අමාවතුරෙහි දන්නා ලැබෙන්නේ දේශීය මාර්ගයට හුරු වන රීතියකි. ගුරුළුගෝමීහුගේ අමාවතුර භාෂාව ද ශ්‍රේෂ්ඨ ග්‍රන්ථ කාරයෙකු අතින් සකස් වුණු ශිලා ලිපි භාෂාව ම ය. සංස්කෘත සාහිත්‍යයෙහි ද හසළ දැනුම ඇති ගුරුළුගෝමීහු සංස්කෘත ගද්‍ය රීතියට වඩා පාලි රීතිය ගුරු කොට සැලකුවෙකි. බෞද්ධ සංස්කෘතියට ද බෞද්ධ රටක පරිසරයට ද ගැළපෙන්නේ වාග් ප්‍රපඤ්චයෙන් හා අලංකාරයෙන් දූෂණය වුණු සංස්කෘත රීතිය නොව පාලි රීතිය ය. එහෙයින් පාලි රීතිය ගුරු කොටගත් ගුරුළුගෝමීන් අතින් හැඩගැසුණු දේශීය මාර්ගයක් ලෙස සැලකිය යුතු අමාවතුර රීතිය නවීන කවර බසක වුව ද උසස් සරල රීතියට දෙවන නොවන්නකි. විද්‍යාචක්‍රවර්තී නිස්සාර සංස්කෘත රීතිය ගුරු කොට නොගෙන අමාවතුර රීතියම තම කවීත්වය නමති කෝචයෙහි දමා මකා සකස් කොට ගන්නේ නම් ගද්‍ය සිංහලය කවි බසක් වශයෙන් පාලි සංස්කෘත යන දෙකට ම වඩා මධුර ලලිත ගුණයෙන් අනූන වියත් බසක් වන්නේ ය. පාලි රීතිය හැර සංස්කෘත රීතිය ගැනීම නියම මැණික් ඉවත දමා වීදුරු මිණි අගය කොට සැලකීමක් වැන්න. විද්‍යාව දර්ශනය අරබයා නම් සංස්කෘත රීතිය වුවමනා ය. (ලකුණු 13 යි)

03. දී ඇති මාතෘකාවලින් එකකට අදාළව වචන 300-350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) ශ්‍රී ලංකාවේ දිනෙන් දින උග්‍ර වන පානීය ජල අර්බුදය.

(ii) විජාතික බලවේග හමුවේ ජාතියක් ලෙස එක්සත් වීමේ වැදගත්කම.

(iii) තරගකාරී අධ්‍යාපනයේ අහිතකර ප්‍රතිවිපාක.

(iv) ප්‍රවෘත්ති වර්තාකරණයේ දී ජනමාධ්‍යයේ වගකීම.

(v) රසික මානසිකත්වය හීන කරන වත්මන් ගීත කලාව. (ලකුණු 25යි)

04. (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) පියා පුතුන් ගුරුවරු කළේය.

(ii) මිනිසුන් දෙදෙන මහමග යති

(iii) යමෙකු පින්කළාහු නම් දිව සැපත ලබති.

(iv) ඔවුහූ අවංක වෙත් නම් අපි සතුටු වෙමු.

(v) මුනිවරු පවසන දෑ බොරු නොවෙයි.

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරයකට හරවන්න.

(i) ඔවුහූ නිළියක ලවා නැටුමක් ඉදිරිපත් කරවූහ.

(ii) සංගීතඥයෝ නව රීතීන් සොයති.

(iii) ඇමතිවරු සාදරයෙන් නිළියක පිළිගත්හ.

(iv) රට ගොඩනැගුවෝ ගොවියෝය.

(v) ගුරුවරු වැඩි දෙනෙක් සිසුන් පැසසූහ.

(ඇ) නිවැරදි වැකියක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) ඔවුහූ වැඩි (දෙනෙක්/දෙනෙකු) (සොරු/සොරුන්) නොවෙති.

(ii) (අපි/අප) (ඔවුන්/ඔවුහූ) එතැයි සිතුවෙමු.

(iii) ඇතැම් (නිලධාරීන්/නිලධාරීහු) බොහෝ විට (සොරු/සොරුන්) සේ ක්‍රියාකරති.

(iv) විශ්ව විද්‍යාල (ශිෂ්‍යයෝ/ශිෂ්‍යයින්) දේශනවලට සහභාගි (වෙයිද/වෙත්ද)

(v) (සතුරන්/සතුරෝ) පරාජය කළ (සෙබළු/සෙබළුන්) එහි යති. (ලකුණු 5 x 3 = 15)

05. පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනුඅංගය දක්වන්න.

1. **කරුණාවන්ත** වෛද්‍යවරුන්ගේ ප්‍රතිකාර **නිසා** **අසරණ** රෝගීහු සුපවත් වේ.
   (කරුණාවන්ත - තද්ධිත, නිසා - නිපාත, අසරණ - අව්‍යපද)
2. **බලා සිටුව** දිය **කෙළනා** **ළඳුන්** සොඳ.
   (බලාසිටුව - ක්‍රියා, කෙළනා - කෘදන්ත, ළඳුන් - සන්ධි)
3. **රජ මැඳුරක** ඉපදී සිටියා **නම්** නුඹත් රජෙකි **පුතුනේ**.
   (රජමැඳුරක - සමාස, නම් - නිපාත, පුතුනේ - විභක්ති)
4. සිසුවා **හුනස්නෙන්** නැගිට **ගුරුතුමාට** **සමාචාර** දැක්වීය.
   (හුනස්නෙන් - සන්ධි, ගුරුතුමාට- සන්ධි, සමාචාර - අව්‍යය පද)
5. **සතර දිසා** ජය ගෙන **මම** **හනික** එමි.
   (සතර දිසා - සමාස, මම - විභක්ති, හනික - නිපාත) (ලකුණු 5 x 3 = 15)

06. පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.
(අම, උෂ්ණ, සාගරය, අමා, උණුසුම්, සයුර)

(අ) 1. දෙව්ලොවෙහි දෙවියෝ ..................................... බොජුන් අනුභව කරති.

2. විමලසේන කුමාරගම ..................................... වන පෙතට පෙම් බැන්දේය.

3. ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ මහතා කවි ..................................... කැළඹුවේය.

4. ඇතැම් වන්දිභට්ටයන් තුළින් රාජ ..................................... වහනය වන බවට ඇතැම්හු පැවසූහ.

5. බෞද්ධයෝ ..................................... දම් ශ්‍රවණය කිරීමෙන් දිවිමග දිනන්නට වෙර දරති.

(ලකුණු 1/2 x 6 = 3)

(ආ) පහත දක්වා ඇති පද සන්ධි කරන්න.

(i) දෙ + ආකාර (ii) මාර්ග + උපකරණ

(iii) කොළඹ + තොට (iv) පුර + අඟන

(v) රුක් + අත්තන (vi) සං + උපකාර (ලකුණු 1/2 x 6 = 3)

(ඇ) තද කළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) **<u>ලේකම්තුමිය</u>** විසින් **<u>වාර්තාව</u>** සභාගත කරන ලදී.

(ii) සන්නාලිය **<u>නූල්වලින්</u>** රටා මවමින් අලංකාර **<u>ඇඳුමක්</u>** වියයි.

(iii) **<u>මුහුදින් හමන සුළඟ</u>** **<u>ගෙවල්වල</u>** දැව දිරාපත් කරන බව සමුද්‍රාසන්න වැසියෝ පවසති.

(ලකුණු 1/2 x 6=3)

(ඈ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන වාක්‍ය නැවත ලියන්න.

(i) වස්සානය වංකගිරියට මාරුවීම පරමල් රත්න ශ්‍රී විජේසිංහ මහතාගේ නිර්මාණ වේ.

(ii) අපි හෙට එනවා කියා ඔවුහු පැවසුවෝය

(iii) දුට්ඨගාමිණී අභය රජතුමා සැබෑ බෞද්ධ රජෙකි (ලකුණු 1/2 x 6 = 3)

(ඉ) පහත දැක්වෙන ප්‍රකාශනවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) මම මගේ අම්මාට හොඳින් සැලකුවෙමි'යි බෝසත් දරුවෙක් පැවසුවේ ය.

(ii) අපි අපේ රට පවිත්‍ර දේශයක් කරමු'යි වර්තමාන තරුණකැල එකහෙළා පවසති.

(iii) මම බුදුසසුන දිවි හිමියෙන් සුරකිමි'යි ජනපති පැවසුවේ ය. (ලකුණු 1 x 3 = 3)

(ලකුණු 15)

07. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**<u>කුරුණෑගල</u>** අනු රාජධානිය කොට විසූ තුන්වෙනි **<u>පරාක්‍රමබාහු</u>** මහරජතුමාණන් විසින් ධාතුප මන්දිරයක් කරවා නොයෙක් ලෙසින් ධාතු පූජා කළ අයුරු දළදා සිරිතෙහි දක්වා තිබේ. බු.ව. 1955 දී පමණ ලක් රජය කළ පස්වෙනි **<u>බුවනෙකබාහු</u>** රජතුමා විසින් කුරුණෑගලින් **<u>ජයවර්ධනපුර</u>** **<u>කෝට්ටේ</u>** දළදා වඩා මහත් පූජා පැවැත්වී ය. ඉක්බිති සවැනි ශ්‍රී පරාක්‍රමබාහු **<u>මහරජතුමා</u>** තුන් මහල් පායක් කරවා එහි දළදා වඩා පුද පැවැත්වීය. මෙය කෝට්ටේ අන්තිම දළදා මැඳුර විය. ඉක්බිති ක්‍රි.ව. 1505 දී පෘතුගීසි උපද්‍රව ඇති විය. එකල සිංහල රාජකුමාරයෙකු වූ **<u>ධර්මපාල</u>** කුමරුගේ මිථ්‍යාදෘෂ්ටිය නිසා සිංහල සිංහාසනය පිළිබඳ නොයෙක් ලෙසින් වියවුල් ඇති කාලයක් විය. එකල හිරිපිටියේ රාල නම් නිලමේතුමෙක් දන්ත ධාතුව රත්නපුර පළාතේ දෙගල්ගමුවට රැගෙන ගොස් ආරක්ෂා කරමින් සිටියේ ය.

(i) ඡේදයේ තද කළු අකුරින් මුද්‍රිත වචන අකාරාදී පිළිවෙළට සකස් කරන්න.

(ii) සිරිතෙහි, අයුරු. පෘතුගීසි යන වචනවල පිලි වෙන වෙන ම ලියන්න.

(iii) ඉහත ඡේදයෙන් උපුටා දක්වන්න.

1. තාලුජ අක්ෂරයක් හා මහප්‍රාණ අක්ෂරයක් එකළග යෙදුණු වචනයක්.
2. ඕෂ්ඨජ අක්ෂරයක් හා රකාරාංශයක් සහිත වචනයක්.
3. අනුස්වාරය හා ඌෂ්මාක්ෂරයක් සහිත වචනයක්.

(iv) පහත සඳහන් පද විසන්ධි කර සන්ධි විධිය දක්වන්න.

සිංහාසනය, නොයෙක්, වියවුල්

(v) පහත දැක්වෙන ක්‍රියා වර්ගවලට උදාහරණ වචනය බැගින් ඡේදයෙන් උපුටා දක්වන්න.

පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා (අතීත ඒක වචනයක්) මිශ්‍ර ක්‍රියා.

08. පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) පර ස්වර ලෝප සන්ධිය (ii) විධි ක්‍රියා (iii) නාම ප්‍රකෘති

(iv) නිෂ්පන්න පද (වචන) (v) මූර්ධජ අක්ෂර (ලකුණු 15)

# දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය 2020 - සිංහල I

## පිළිතුරු පත්‍රය - I

### I පත්‍රය

01. (අ) (i) දිව්‍ය පුත්‍රයාගේ අනුසාසනාව අසා / මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයාගේ අනුශාසනාව අසා
(ii) පෙර සිට දැන හැඳින නොසිටිය ද යමෙකුගේ ගැටලුවක දී පිහිට වීම නිසා.
(iii) ඔබගේ අවවාද අනුශාසනා මත පිහිටා මෙතැන් සිට දරුවා වෙනුවෙන් ශෝකයක් ඇතිකර නොගනිමි.
(iv) දැ යනු දෙකක් යන් අර්ථ දෙන අතර තුර යනු අතරතුරයි. ඒ අනුව උපතත් මරණයත් අතර කාලය මින් අදහස් වේ.

(ආ) (i) හුදකලාව වනයට ගොස් බඹසර විසීම. (තපස් රැකීම)
(ii) ශාක්‍ය කුලවතුන් නොවන උදායී ආදී අය පැවිදිවී නිර්වාණබෝධය ලබා ආකාශයෙන් වැඩම කිරීම, ඔවුනට වැඳුම් පිදුම් සංග්‍රය කිරීම.
(iii) ''විසිනව වැනි අවුරුද්දේ දී පංචකාම වස්තුන්ගේ සැප හැර දමා''
(iv) පුද්ගලයෙකුගේ සම රැලි වැටීම, කෙස් පැසීම ආදී ලෙස මහලු බවට පත්වීම.

(ඇ) (i) තඹවල හටගත් මලයක් (මලකඩ) ඇඹුල්වලින් ඉවත් කරන පරිදි
(ii) බුදුන් වහන්සේගේ දෙවුර (උරහිස්)
(iii) ඉණෙහි බඳින පටිය (ධාතුන් වහන්සේ යන්න බුදුන් වහන්සේ භාවිත කළ නිසා ගෞරවය පිණිස යෙදෙයි)
(iv) ත්‍රිමණ්ඩල යන්න මණ්ඩලාකාරව පෙනෙන ස්ථාන තුන අදහස් කරන අතර පටිච්ඡාදන යනු වැසීමයි. ඒ අනුව මණ්ඩාලාකාරව පිහිටි නාභිය හා දෙදණ වැසෙන පරිද්දෙන් යන්න අදහස් වේ.

(ඈ) (i) ඉතා මානයෙන් යුතු වීම.
(ii) තම කුල මානය නැතිකර ගැනීමට / පැවිදි පිළිවෙත් සාර්ථක කරගැනීමට/ යළි රාජ්‍ය ලෝභය ඇති නොකර ගැනීමට. (මෙම පිළිතුරු අතරින් 1ක් ඇත්නම් ලකුණු ප්‍රදානය කරන්න)
(iii) නුඹලාගේ කරණවැමියාට වැඳුම් පිදුම් කිරීම් ආදී පහත් ක්‍රියා කොට යළි රජකම් කිරීමට ආවේදැයි'
(iv) නින්දා සහගත වචන කියමින් පහත් කොට කථා කිරීම.

(ඉ) (i) අලුයම මහාකරුණා සමාපත්තියට සමවැදී පිහිට වීමට සුදුසු පින්කර ඇති පුද්ගලයින් පිළිබඳව බැලීම.
(ii) තමන් කෙරෙහි සිත පහදවා ගෙන ඒ පිනෙන් මට්ටකුණ්ඩලී, දෙව්ලොව මහත් සැප ඇති ආත්මභාවයක් ලැබීම.
(iii) තමන් වහන්සේගේ ඥානය නමැති දැල දස දහසක් වූ චක්‍රාවාට (ක්ෂීරපථ) වසා දැමීම.
(iv) මට්ට යනු මට සිලිටි බවයි. කුණ්ඩල යනු කර්ණාභරණයයි. ඒ අනුව, මටසිලිටි කර්ණාභරණ පැළඳ සිටි යන අර්ථය ලබාදේ.

(ඊ) 1. 13 වන සියවසෙහි දඹදෙනි යුගයේ විසූ ධර්මසේන හිමිපාණන් විසින් රචිත සද්ධර්ම රත්නාවලියේ මට්ටකුණ්ඩලී කතා වස්තුවේ එන පාඨයකි.

බුදුන් වහන්සේ අලුයම් වේලෙහි මහා කරුණා සමාපත්තියට සමවැද සිටි කල්හි මරණාසන්නව ගෙපිලමත සිටි මට්ටකුණ්ඩලී දරුවා තම නුවණැසින් දුටු මොහොතේ බුදුන් වහන්සේ විසින් සිතන ලද්දකි.

2. 13 වන සියවසෙහි දඹදෙණි යුගයේ විසූ මයුරපාද පිරිවෙන්පති බුද්ධපුත්‍ර හිමියන් විසින් රචිත පූජාවලියෙහි අනුරුද්ධ කුමාර කතාවේ ඇතුළත් පාඨයකි.

මහානාම ශාක්‍ය කුමරු තම මලණුවන් වූ අනුරුද්ධ කුමරු සමීපයට කැඳවා අප දෙදෙනාගෙන් කෙනෙක් බුදුන් කරා ගොස් පැවිදි විය යුතු බව දන්වා, පැවිදි වන්නේ කවුරුන්දැයි විමසූ කල්හි අනුරුද්ධ කුමරු පැවිදි වීමට තම අකමැත්ත පල කරමින් තම සහෝදරයා වූ මහානාම කුමරු අමතා පවසන ලද්දකි.

3. 13 වන සියවසෙහි දඹදෙණි යුගයේ විසූ මයුරපාර පිරිවෙන්පති බුද්ධපුත්‍ර හිමියන් විසින් රචිත පූජාවලියෙහි අනුරුද්ධ කුමාර කතාවේ ඇතුළත් පාඨයකි.

අනුරුද්ධ කුමරු උපයා කෑමෙහි හා සසරේ ස්වභාවය වටහාගෙන පැවිදිවීමට කැමති වී තම මෑණියන් වන සඳ දේවිය වෙත පැමිණ පැවිදි වීමට අවසර පතන අවස්ථාවේ සඳ දේවිය විසින් අනුරුද්ධ කුමරු අමතා පවසන ලද්දකි.

4. 13 වන සියවසෙහි දඹදෙණි යුගයේවිසූ ධර්මසේන හිමියන් විසින් රචිත සද්ධර්ම රත්නාවලියෙහි ඇතුළත් මට්ටකුණ්ඩලී වස්තුවෙහි එන පාඨයකි.

අදින්න පුබ්බක බ්‍රාහ්මණයාගේ සැක දුරු කරනු පිණිස පිරිස මැදට, මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයා තමන් පුණ්‍ය බලයෙන් ලද සියලු දිව්‍ය සම්පත් සහිතව බුදුහිමියන් සමීපයට සම්ප්‍රාප්ත වූ අවස්ථාවේ බුදුහිමි විසින් මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයාගෙන් විමසන ලද්දකි.

5. දැන් වෙලාව කීයට විතර ඇද්ද?

මාර්ටින් වික්‍රමසිංහ මහතා විසින් රචිත වහල්ලු කෙටි කතාවේ එන පාඨයකි.

උපාලිස්ගේ බිරිඳ අලුයම නිවසේ දොර ඇරගෙන එනවිට හඳයා උපාලිස් අසලට පැමිණ අවදිකරවන අයුරු දුටු බිරිඳ හඳයා ගැන කතා කරන අවස්ථාවේ උපාලිස් විසින් තම බිරිඳගෙන් විමසන ලද්දකි.

(එ) නිර්මාණයේ ආකෘතිය, ජීවන දර්ශනය කෙරෙහි මූලික අවධානය යොමු කරමින් පද්‍යයෙහි අනෙකුත් අංග සාකච්ඡා කිරීම යෝග්‍ය වේ.

* **අංක 02 සිට 08 දක්වා ප්‍රශ්නවල අන්තර්ගතයට ගැළපෙන ලෙස පිළිතුරු ලබාදී ඇත්නම් ඒ සඳහා සුදුසු ලකුණක් ප්‍රදානය කරන්න. මෙහිදී ගුරු මාර්ගෝපදේශයේ ඇතුළත් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරන්න.**

## පිළිතුරු පත්‍රය II
## I කොටස
## II පත්‍රය

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 01. | 1.1 | 3 | 1.6 | 2 | 1.11 | 2 | 1.16 | 1 |
| | 1.2 | 1 | 1.7 | 5 | 1.12 | 5 | 1.17 | 1 |
| | 1.3 | 2 | 1.8 | 3 | 1.13 | 3 | 1.18 | 4 |
| | 1.4 | 2 | 1.9 | 5 | 1.14 | 1 | 1.19 | 3 |
| | 1.5 | 2 | 1.10 | 1 | 1.15 | 2 | 1.20 | 3 |

02. (අ) 1.(i) දියුණු කරන නායකත්ව සංකල්පයේ අපැහැදිලිබව.

(ii) විශ්වවිද්‍යාල පද්ධතියෙන් බිහිකරන නායකයින් තාවකාලික නායකයින් වීම.

(iii) ශිෂ්‍ය ව්‍යාපාරවලින් බිහිකරන නායකයින් බාහිර දේශපාලන බලවේග මගින් තීරණය කිරීම.

2. බාහිර දේශපාලන බලවේග මගින් නිර්මාණය කළ නායකයින් වීම.

3. නැත.

4. විශ්වවිද්‍යාල ඉතිහාසය, සම්ප්‍රදාය, විශ්ව විද්‍යාල ජීවිතය, විශ්ව විද්‍යාල ප්‍රජාව පිළිබඳ විධිමත් දැනුමක් ලබාදීම.

5. සරසවි ආචාර්යවරුන්.

6. ක්ෂේත්‍රයකට හුරුවීම/ අනුගතවීම පිළිබඳ ලබාදෙන විධිමත් දැනුම/පුහුණුව/මාර්ගෝපදේශය.

(ආ) (i) වචන 60 - 65 අතර විය යුතුයි.

* සිංහල පද්‍ය හා ඇතැම් ගද්‍ය පාලි මෙන් ම සංස්කෘත රීතිය අනුගමනය කර තිබේ.
* අමාවතුරෙහි පාලි රීතිය යොදාගෙන ඇති අතර එය දේශීයත්වයට නැඹුරුය.
* විද්‍යා චක්‍රවර්තී සංස්කෘත රීතියට වඩා අමාවතුර රීතිය භාවිත කළේ නම් එය උසස් රීතියක් වනු ඇත.
* විද්‍යාව හා දර්ශනය අරභයා සංස්කෘත රීතිය උචිත වේ.
* බෞද්ධ රටකට වඩාත් ගැළපෙන්නේ පාලි රීතියයි.

03. වාක්‍ය රචනයඃ වාක්‍ය රචනයට ලකුණු දීමේ දී පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

* වචන සංඛ්‍යාව 300- 350 ත් අතර තිබීම යෝග්‍ය වේ. වචන 400ට වැඩි වේ නම් හෝ 250ට අඩුවේ නම් හෝ ලකුණු 03ක් අඩුකරන්න.
* තෝරාගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු දැක්වීම.
* සංවිධානාත්මක බව.
* නිර්මාණාත්මක බව හා ස්වීයත්වය.
* කරුණුවල පැහැදිලි බව හා තර්කානුකූල බව.
* ව්‍යක්ත භාෂාව, නිවැරදි අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ දෝෂ රහිතවීම, පද බෙදීම හා ඡේද වෙන්කිරීම කියවීමට හැකිවන සේ පැහැදිලි අත් අකුරු තිබීම.

04. (අ) 1. පියා පුතුන් ගුරුවරුන් කළේය. 2. මිනිස්සු දෙදෙන මහමග යති.
3. යමෙක් පින් කළාහු නම් දිවසැපත ලබති. 4. නිවැරදි වාක්‍යකි.
5. මුනිවරුන් පවසන දෑ බොරු නොවෙයි.

(ආ) 1. ඔවුන් විසින් නිළියක ලවා නැටුමක් ඉදිරිපත් කරවන ලදී. / කරවනු ලැබීය. / කරවනු ලැබිණ.
2. සංගීතඥයන් විසින් නව රීතීහු සෙවෙති./සොයනු ලබති./සොයනු ලබත්/සොයනු ලැබෙති/සොයනු ලබත්.
3. ඇමතිවරුන් විසින් සාදරයෙන් නිළියක් පිළිගනු ලැබූවාය./පිළිගනු ලැබුණා ය./පිළිගන්නා ලද්දීය. / පිළිගැණුණාය.
4. රට ගොඩ නගන ලද්දේ ගොවියන් විසිනි. ගොවියන් විසින් රට ගොඩනගන ලදී./ලැබීය./ලැබිණ.
5. ගුරුවරුන් වැඩිදෙනෙකු විසින් සිසුහු පසසනු ලැබූහ./ලැබුවෝය./ලැබුණෝය./ලැබුණාහ./ලැබුණු.

(ඉ) 1. දෙනෙක් / සොරු 2. අපි / ඔවුන් 3. නිලධාරීහු/ සොරුන්
4. ශිෂ්‍යයෝ / වෙත්ද 5. සතුරන් / සෙබළු

05. (i) කරුණාවන්ත - යුක්තාර්ථය. නිසා - හේත්වර්ථය. අසරණ - උපසර්ග
(ii) බලා සිටුව - විධික්‍රියා කෙළනා - වර්තමාන කෘදන්ත ළඳුන් - පූර්වස්වර ලෝප.
(iii) රජ මැදුරක - සම්බන්ධ විභක්ති සමාසය
නම් - අවධාරණාර්ථයේ නිපාත
පුතුනේ - ආලපන විභක්තිය.
(iv) හුනස්නෙන් - ස්වර සන්ධිය ගුරුතුමාට - පරස්වර ලෝප සන්ධිය සමාචාර - උපසර්ග
(v) සතරදිසා - විශේෂණ සමාස/සංඛ්‍යාපූර්ව පද විශේෂණ සමාස
මම - ප්‍රථමා විභක්ති හනික - ශීඝ්‍රාර්ථය

06. (අ) (i) අම (ii) උණුසුම් (iii) සයුර (iv) සාගරය (v) අමා
(ආ (i) දෙයාකාර (ii) මාර්ගෝපකරණ (iii) කොළොම්තොට
(iv) පුරගන (v) රුක්කත්තන (v) සමුපකාර
(ඇ) (i) කර්තෘ විභක්තිය - පෙර/ප්‍රථම විභක්තිය
(ii) කරණ විභක්තිය - කර්ම විභක්තිය
(iii) අවධි විභක්තිය - සම්බන්ධ විභක්තිය
(ඈ) (i) වස්සානය, වංගකිරියටමාරුවීම, පරමල් රත්න ශ්‍රී විජේසිංහ මහතාගේ නිර්මාණ වේ.
(ii) ''අපි හෙට එනවා'' කියා ඔවුහු පැවසුවෝය.
(iii) 'දුට්ඨගාමිණී අභය' රජතුමා සැබෑ බෞද්ධ රජෙකි.

(ඉ) (i) තමා තමාගේ මවට හොඳින් සැලකූ බව බෝසත් දරුවෙක් පැවසුවේය.
(ii) තමන් තමන්ගේ රට පවිත්‍ර දේශයක් කිරීමට සූදානම් බව වර්තමාන තරුණ කැල එක හෙළා පවසති.
(iii) තමා බුදු සසුන දිවි හිමියෙන් සුරකින බව ජනාධිපතිතුමා පැවසුවේය.

07. (i) කුරුණෑගල, කෝට්ටේ, ජයවර්ධන පුර, ධර්මපාල, පරාක්‍රමබාහු, බුවනෙකබාහු මහරජතුමා.
(ii) සිරිතෙහි - කෙටි ඉස්පිල්ල, කෙටි ඉස්පිල්ල, කොම්බුව, කෙටි ඉස්පිල්ල.
අයුරු - කෙටි පාපිල්ල, කෙටි පාපිල්ල.
පෘතුගීසි - ගැටපිල්ල, කෙටි පාපිල්ල, දීර්ඝ ඉස්පිල්ල, කෙටි ඉස්පිල්ල.
(iii) 1. රාජධානිය. 2. උපද්‍රව/පරාක්‍රමබාහු 3. සිංහල/සිංහාසනය
* වෙනත් නිවැරදි පිළිතුරු ද පිළිගන්න.
(iv) සිංහාසනය - සිංහ + ආසනය - දීර්ඝ සන්ධිය/සමාන ස්වර දීර්ඝ සන්ධිය
නොයෙක් - නො + එක් - ආගම සන්ධිය
වියවුල් - වි + අවුල් - ආගම සන්ධිය
* නිවැරදිව විසන්ධි කර සන්ධි වර්ගය දක්වා තිබිය යුතුය. (විසන්ධි කර පියවර ලෙස දක්වා තිබුණ ද පිළිගන්න.)
(v) පූර්ව ක්‍රියා - කොට/දක්වා/වඩා/ගොස්
අවසාන ක්‍රියා - පැවැත්වීය / සිටියේ ය.
මිශ්‍ර ක්‍රියා - කරමින්.

NWP - EXAM

* වෙනත් නිවැරදි පිළිතුරු ද භාරගන්න.

08. මෙහි හැඳින්වීමට ලකුණු 2යි, උදාහරණවලට ලකුණු 3යි.

(i) පරස්වර ලෝප සන්ධිය.

සිඳත් සඟරාවේ මෙම සන්ධිය 'පර සර ලොප් සඳ' යනුවෙන් හැඳින්වේ. සන්ධි වන පද දෙකෙන් දෙවන පදයේ (පර පදයෙ) මුල් ස්වරය ලොප් කොට, පළමු පදය (පෙර පදය) හා ගැළපීමෙන් සකසා ගන්නා සන්ධිය පර ස්වර ලෝප සන්ධිය නම් වේ.

උදාහරණ : ගුරු + උතුමා = ගුරුතුමා.

කුල + අඟන = කුලඟන.

මුදලි + ඉඳු = මුදලිඳු.

බුදු + අකුරු = බුදුකුරු.

(ii) විධි ක්‍රියා

විධානයක්, අණ කිරීමක්, ආයාචනයක්, ඉල්ලීමක් හඟවන පද විධි ක්‍රියා වේ.මෙය ආදරයෙන් හෝ අනාදරයෙන් හෝ ගෞරවයෙන් කළ හැකිය. මේ සඳහා නිදසුන් ලේඛන ව්‍යවහාරයේ මෙන් ම භාෂාණ ව්‍යවහාරයෙන් ද දැක්විය හැකිය. සිදතෙහි මෙය 'විදි කිරිය' නමින් දක්වා ඇත.

උදාහරණ : 'නු' ප්‍රත්‍යය - නිශ්ශබ්ද ව**නු** , බිය නොව**නු**

'නුය' ප්‍රත්‍යය - නොතළ**නුය** මා දුබල ජීවය

'න්ට' - මට අවසර දෙ**න්ට**, දෙ**න්ට** මට අවසර

'න්න' ප්‍රත්‍යය - මෙහි එන්න , කීකරු වන්න

'ව' ප්‍රත්‍යය - යුදයට සැරසෙව , නොවළහා කියව

'වු/වි' ප්‍රත්‍යය - ඉදිරියට ම යවු , මේ දෙස බලව්

'පන්/පං' - මට ම තළපන් / තළපං , ඇත්ත කියපන් / පං

'පිය' - කට වහපිය

මැනවි/මැනව/යෙහෙකි යෙදෙන ආකාරය පෙනේ.

කියනු මැනවි/මැනව , දෙනු මැන.

පැමිණීම යෙහෙකි / යහපති

(iii) නාම ප්‍රකෘති

විභක්ති ප්‍රත්‍යය, තද්ධිත ප්‍රත්‍යය යන නාම ප්‍රත්‍යයන්ට මුලින් යෙදී නාම පද, තද්ධිත නාම ආදිය නිර්මාණයට මුල් වන්නේ නාම හෙවත් නාම ප්‍රකෘතිය යි. ශබ්ද ප්‍රකෘති යනු ද ඊට නමකි. 'විබතැනට ඇසිරු සද පියෙවි නම්' යනු සිඳත් සඟරා පාඨයයි. මෙහි 'සද පියෙවි' යනු ශබ්ද ප්‍රකෘතියයි.

නාම පදයකින් නාම ප්‍රකෘතියක් වෙන් කොට හඳුනා ගැනීමේ විධිමත් ක්‍රමය වන්නේ සමාස පදයක මුල් කොටස විමසීමයි. සමාස පදයක මුල් කොටස ප්‍රකෘතියකින් සැදී තිබේ.

උදාහරණ : ඉබිකට්ට, ඉබියතුර ඉබි - ප්‍රකෘතිය වේ.

මව්කිරි, මව්බිම මව් - ප්‍රකෘතිය වේ.

ගස් දෙබල , ගස් ගඳ ගස් - ප්‍රකෘතිය වේ.

(iv) නිෂ්පන්න පද

වෙනත් භාෂාවකින් නොපැමිණි තම දේශයෙහිම පහළ වූ හෙවත් නිපදුණු වචන (පද) වේ. 'කිසි අන්බසින් නුමුසු හෙළදිවැ පළ නිපන් නම්' යනු සිදත් සඟරා පාඨයයි. මෙහි 'නිපන්' යනු නිෂ්පන්න පද වේ.

උදාහරණ : කොළ, අළු, ළඳ, නරඹ, ඔළුව, කකුල, කලව, කොළඹ, කෝරළ, ළය, ළිං, කොටි

(v) මූර්ධජ අක්ෂර :

උච්චාරණයේ දී මුඛ කුහරයේ මුඳුනින් උපදින අකුරු මේ නමින් හැඳින්වේ. දිව් තුඩ උඩුතල්ලේ මුදුනෙහි ස්පර්ශ වීමෙන් උපදින ව්‍යංජන ශබ්ද මූර්ධජ අක්ෂර වේ.

උදාහරණ : ඍ, ඎ, ට, ඨ, ඩ, ඪ, ණ

ර, ෂ, ළ

කනිෂ්ඨ, ආරූඪ, වණ, මළ, වර්ෂය, ඍණ


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440